**මහ කොළඹ ජලය හා අප ජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩ සටහන - 2 කොටස - 2018**

---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන වැඩ සටහනේ - 2 කොටසේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 ජුනි 03 දින එළඹි අංක 3030 දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැ සටහනේ කාලය

ණය ගිවිසුමට අනුව, අභ්‍යන්තර සහ ස්වදේශ කටයුතු සහ පළාත් සභා, පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කොළඹ මහනගර සභාව සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජලය සේවා වැඩිදියුණු කිරීම හා කළමනාකරණය කිරීම සහ මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදනය හා අපජල සේවා පිළිබඳ කාර්යක්ෂමතාවය හා මූල්‍ය තිරසාරත්වය වැඩිදියුණු කිරීම වැඩසටහනේ අරමුණු වේ. ණය ගිවිසුම ප්‍රකාරව වැඩ සටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,230.60 කට සමාන එජඩො මිලියන 9.44 ක් වන අතර ඉන් රු.මිලියන 1,042.88 කට සමාන එජඩො මිලියන 08 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 187.22 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. වැඩසටහන එහි කාර්යයන් 2014 සැප්තැම්බර් 23 දින ආරම්භ කරන ලද අතර 2019 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් තිබුණි. කෙසේ වෙතත්, වැඩසටහනේ කටයුතු අවසන් කිරීමේ දිනය 2020 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, වැඩසටහනේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

වැඩසටහන වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | මුදල රු.මිලියන | බලපෑම | කළමනාකරණයට අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| විදේශ විනිමය ගණුදෙනු මත විනිමය ලාභය ජංගම නොවන වත්කම් වල වටිනාකමින් අඩුකර තිබුණි. | 2.17 | ජංගම නොවන වත්කම්වල සහ වගකීම්වල වටිනාකම අඩුවෙන් දැක්වේ. | වඩාත් සුදුසු ගිණුම්කරණ ක්‍රමවේදය යොදා ගැනීමට පියවර ගනු ලැබේ. | ජංගම නොවන වත්කම්වල සාධාරණ අගය දැක්විය යුතුය. |

### 2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 6 (01) (අ) වගන්තිය | පිරිවැය රු.මිලියන 5 හෝ ඊට වැඩි කොන්ත්‍රාත් පිළිගත් කොන්ත්‍රාත්කරුවන් විසින් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි විය යුතු අතර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසු දින 60 ක් ඇතුළත කොන්ත්‍රාත් ගිවිසුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කළ යුතුය. කෙසේ වෙතත්, සිවිල් ඉදිකිරීම් සහ සැපයුම් කොන්ත්‍රාත්කරුවන් මෙම අවශ්‍යතාවයන්ට අනුකූල වී නොතිබුණි. | නීතිමය සහ බඳු සම්බන්ධ ගැටළු මත කොන්ත්‍රාත්කරුවන්ට එරෙහිව පියවර ගැනීමට නොහැකි වේ. | නීතිමය අවශ්‍යතාවන් සමඟ අනුකූලවීමට කොන්ත්‍රාත්කරුවන්ට දැනුම්දීමට පියවර ගෙන තිබුණි. | මෙම අවශ්‍යතාවන් සමඟ අනුකූලවීමට කොන්ත්‍රාත්කරුවන්ට පෙළඹවීමට පියවර ගැනීමට අවශ්‍ය වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 වැඩ සටහනේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

මලාපවහන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, ආයතනික සහ මෙහෙයුම් ධාරිතාවය ශක්තිමත් කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණය සහ ආයතනික සහය යනාදි සංරචක 3 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වෙතත්, වැඩසටහනේ කටයුතු ආරම්භයේ සිට වැඩසටහන සඳහා විස්තරාත්මක ක්‍රියාත්මක කිරීමේ සැලසුමක් නොතිබුණි. ලැබී තිබුණු තොරතුරු අනුව වැඩසටහනේ කටයුතු ආරම්භයේ සිට වර්ෂ 4 ½ කට පසු ණය නියෝජිතායතනය මඟින් සපයන ලද රු.මිලියන 1,042.88 කට සමාන එජඩො මිලියන 8.00 ක ප්‍රතිපාදනයෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 172.40 කට සමාන එ.ජ.ඩො. මිලියන 1.10 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | සංරචකය | විගණන ගැටළුව | බලපෑම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|
| (අ) | අපජල කළමනාකරණ පද්ධතිය පිළිබඳ විස්තරාත්මක සැලසුම සහ ලංසු ලියවිලි පිළියෙල කිරීම | කිරුලපන මලාපවහන මාර්ගයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව යටතේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | වැඩ සටහනේ අපේක්ෂිත අරමුණු වැඩසටහනේ දීර්ඝ කරන ලද කාල පරිච්ඡේදය තුළදී ඉටු නොවේ. | තලකොටුව ගාර්ඩ්න් පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම වෙන් කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් |
| (ආ) | තත්ත්ව පරීක්ෂාව සිදුකිරීම, සීසීටීවී සමීක්ෂණයක් සිදුකිරීම සහ අප ජල නාලිකා පිරිසිදු කිරීම. | සීසීටීවී තාක්ෂණය භාවිතයෙන් අප ජල පිරිසිදු කිරීමේ සමීක්ෂණය සහ කිලෝමීටර් 108 ක අප ජල නාලිකා පිළිබඳ දත්ත පද්ධතියක් පිළියෙල කිරීම 2016 ජුලි 01 දින ආරම්භ කිරීමට සැලැසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ඒ සඳහා වන කොන්ත්‍රාත්තුව 2018 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රදානය කර නොතිබුණි. | වැඩසටහනේ අපේක්ෂිත අරමුණු වැඩසටහනේ දීර්ඝ කරන ලද කාල පරිච්ඡේදය තුළදී ඉටු නොවේ. | සුදුකම්ලත් සේවා සැපයුම්කරුවන් තෝරා ගැනීමේ මන්දගාමී බව හේතුවෙන් |

**කළමනාකරණයේ අදහස් දැක්වීම්** — වර්තමානයේ නැවත ලංසු කැවීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකර ඇති අතර කොන්ත්‍රාත්තුවේ කාලපරිච්ඡේදය දීර්ඝ කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

**විගණකගේ නිර්දේශය** — වැඩ සටහනේ කාලපරිච්ඡේදය අවසන් වීමට පෙර වැඩ සටහනේ කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට කඩිනම් පියවර ගැනීමට අවශ්‍ය වේ.

### 3.3. පාරිසරික කරුණු සම්බන්ධයෙන් ගැටළු

| විගණන ගැටළු | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2018 ඔක්තෝබර් 22 දින සිට බලපැවැත්වෙන පරිදි ව්‍යාපෘතියේ පරිසර නිලධාරියා ඉවත්ව තිබුණි. ණය ගිවිසුමේ 5 වන උපලේඛනය අනුව, වැඩසටහනේ | වැඩසටහනේ කටයුතු පිළිබඳව පාරිසරක තක්සේරු නිරන්තරයෙන් සිදුකිරීමට නොහැකි වේ. | පරිසර නියාමන අවශ්‍යතාවය සමඟ අනුකූල වීම සහතික කිරීම සඳහා තාවකාලික විධිවිධාන යොදා ඇත. පුරප්පාඩුව පිරවීම සඳහා දැනටමත් පියවර ගෙන ඇත. | වැඩසටහනේ කටයුතු පරිසරයට සංවේදී බැවින් මෙම අවශ්‍යතාවය අනිවාර්ය වේ. එම නිසා පරිසර නිලධාරියකු බඳවා ගැනීම සඳහා කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |

පාරිසරික කාර්ය සාධනය නිරන්තරයෙන් නියාමනය කළ යුතු අතර ඒ පිළිබඳ වාර්තා ණය නියෝජිතායතනය වෙත අර්ධ වාර්ෂිකව ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙනත්, පාරිසරික නියාමන වාර්තා සහ සමාජ ආරක්ෂණ නියාමන වාර්තා සකස් කර ඉදිරිපත් කර නොතිබුණි.

## 3.4 මානව සම්පත් කළමනාකරණයට අදාල ගැටළු

| කාර්ය මණ්ඩල තනතුරු | 2018 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තත්ත්වය | | | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | අනුමත | තත්‍ය | පුරප්පාඩු සංඛ්‍යාව | | | |
| ව්‍යාපෘති කළමනාකරු | 1 | 1 | 0 | වැඩ සටහනේ කටයුතු වල සුමට ක්‍රියාකාරිත්වයට බලපානු ඇත. | වැඩබිම්වල ඉදිකිරීම් අධීක්ෂණ රාජකාරි සඳහා මෙම තනතුරු අවශ්‍ය වේ. අදාල කොන්ත්‍රාත් පිරිනමන තෙක් සමහර තනතුරු සඳහා බඳවා ගැනීම ප්‍රමාද වී ඇත. | සුදුසු පුද්ගලයින් යෙදවීම සඳහා කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| ඉදිකිරීම් ඉංජිනේරු | 2 | 1 | 1 | | | |
| ව්‍යාපෘති ඉංජිනේරු | 8 | 2 | 6 | | | |
| සහකාර ව්‍යාපෘති ඉංජිනේරු | 7 | 3 | 4 | | | |